# මාධ්‍ය නිවේදනය

## ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ විභාග - 2024 (2025)

## (ප්‍රාචීන පණ්ඩිත ප්‍රාරම්භ/ මධ්‍යම/ සාමාන්‍ය උපාධි)

2025 අප්‍රේල් මාසයේදී පැවැත්වීමට නියමිත “ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ විභාග - 2024 (2025)” සඳහා මාර්ගගතව අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ හැකි අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි මහ පිරිවෙන්, විද්‍යායතන පිරිවෙන්, බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතන හා විශේෂ පිරිවෙන්වලට අදාළ පරිශීලක නාම හා මුරපද මේ වන විට නිකුත් කර ඇත. පරිශීලක නාම හා මුරපද නොලද ලියාපදිංචි පිරිවෙන් වේ නම්, ඒ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන අංශයෙන් විමසිය යුතුය.

මෙම විභාගයට ඉදිරිපත් වන පෞද්ගලික අයදුම්කරුවන්ට ද විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හරහා මාර්ගගතව අයදුම් කිරීමට අවශ්‍ය පහසුකම් සලසා ඇත. මාර්ගගත අයදුම්පත් ඉදිරිපත් කිරීම පිළිබඳ උපදෙස් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කර ඇත. මාර්ගගත අයදුම්පත් භාරගැනීම 2025 පෙබරවාරි මස 19 දින පෙ.ව. 9.00ට ආරම්භ වන අතර 2025 මාර්තු මස 05 දින ප.ව. 9.00ට අවසන් වේ.

අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා සබැඳිය;  https://onlineexams.gov.lk/eic/index.php/clogin/piriven

එච්.ජේ.එම්.සී. අමිත් ජයසුන්දර
විභාග කොමසාරිස් ජනරාල්

2025.02.18 වන දින,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.

tamilguru.lk